සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ''මහණෙනි, ඔබට දැන් මවක නැත. පියෙකු නැත. මෙබඳු අවස්ථාවකදී එකිනෙකා ඔවුනොවුන්ට උපකාරීව සහයෝගයෙන් ක්‍රියා කළ යුතු ය.'' බුදුන් වහන්සේ මෙසේ වදාළේ,
1. පූතිගත්ත තිස්ස තෙරුන් මුල්කරගෙන ය.
2. මහා කාශ්‍යප තෙරුන් මුල්කරගෙන ය.
3. උදරාබාධයකින් පෙළුණ භික්ෂුවක් මුල්කරගෙන ය.
4. මුගලන් මහරහතන් වහන්සේ මුල්කරගෙන ය.

02. බුදුරජාණන් වහන්සේ දින චර්යාවේ දී දෛනිකව මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ සිට පිහිට විය යුත්තේ කා හටදැයි විමසා බලන කාලය ඇතුළත් වරණය වන්නේ,
1. පැසුළුයම් කිස ආරම්භයේ දී ය.
2. පෙරයම් කිස ආරම්භයේ දී ය.
3. මැදියම් කිස අවසානයේ දී ය.
4. පසුබත් කිස ආරම්භයේ දී ය.

03. බුදුරජාණන් වහන්සේට වේරංජාවේ දී 'යව' නම් කටුක ආහාරය වළඳමින් කල්ගෙවීමට සිදු වූයේ,
1. පස්වන වස් කාලයේ දී ය.
2. දහවන වස් කාලයේ දී ය.
3. හතරවන වස් කාලයේ දී ය.
4. දොළොස්වන වස් කාලයේ දී ය.

04 සිදුහත් බෝසතාණන් වහන්සේ 'සත්‍ය ගවේසීව' සිටි සමයේ උන්වහන්සේට මුණ ගැසුණ අෂ්ඨ සමාපත්තිලාභීව සිටි තවුසා වන්නේ,
1. ආලාර කාලාම
2. උද්දකරාමපුත්ත
3. කාලදේවල
4. භග්ගව

05. ධර්ම රත්නයේ ගුණ අතර 'තමා විසින්ම පිළිපැද, මෙලොව දී ම ප්‍රතිඵල දැකගත හැකිවීමේ ගුණය' හැඳින්වෙන්නේ,
1. අකාලික නමිනි
2. ඒහිපස්සික නමිනි
3. සන්දිට්ඨික නමිනි
4. ඕපනයික නමිනි

06. පුද්ගලයෙකුගේ උපතේ සිට මරණය දක්වාත් ඉන් පසුවත් නිශ්ශරණාධ්‍යාශයෙන් ම සමාජ මෙහෙවරෙහි යෙදෙන්නේ,
1. බෞද්ධ භික්ෂුවකි.
2. පසේ බුදුවරයෙකි.
3. සක්විති රජෙකි.
4. අනගාරික වූවෙකි.

07. ආහාරෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම නිසා (ආහාරේ මත්තඤ්ඤුතා) යහපත් ප්‍රතිඵල ලැබෙන බව සඳහන් වන්නේ,
1. ගිරිමානන්ද සූත්‍රයේ ය.
2. දෝණපාක සූත්‍රයේ ය.
3. භද්දාලි සූත්‍රයේ ය.
4. සිගාලෝවාද සූත්‍රයේ ය.

08. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව වනයේ අතරමං වූවෙකුට උපමා කර ඇති නීවරණය වන්නේ,
1. කාමච්ඡන්ද නීවරණය
2. විචිකිච්ඡා නීවරණය
3. උද්ධච්ච කුක්කුච්ච නීවරණය
4. ථීනමිද්ධ නීවරණය

09. බෞද්ධ ඉගැන්වීම අනුව සමාධි භාවනාව වැඩීමෙන් ලැබිය හැකි ඉහළම ප්‍රතිඵලය වන්නේ,
1. සප්ත සමාපත්ති ලාභය යි.
2. පංච අභිඥා සප්ත සමාපත්තියයි.
3. අෂ්ඨ සමාපත්ති ලාභය යි.
4. පංච අභිඥා අෂ්ඨ සමාපත්තියයි.

10. ''ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල් ය. පිටත ද අවුල් ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටී. කවරෙක් නම් මේ අවුල් නිරවුල් කරන්නේ ද?'' යනුවෙන් බුදුන් වහන්සේගෙන් විමසුයේ,
1. දෙවියෙකි. 2. බමුණෙකි. 3. පරිබ්‍රාජකයෙකි. 4. ගෘපතියෙකි.

11. ත්‍රිවිධ රත්නයේ ගුණ නුවණින් දැන ඇති කර ගන්නා පැහැදීම ධර්මයේ හඳුන්වනුයේ,
1. අමූලිකා ශ්‍රද්ධාව නමිනි. 2. අවෙච්ඡපසාදය නමිනි.
3. භක්තිය නමිනි. 4. සල්ලේඛ ප්‍රතිපදාව නමිනි.

12. බහුජාතික බහුආගමික සමාජයක සහජීවනයෙන් ජීවත්වීම සඳහා ඉවහල් වන කරුණු ඇතුළත් බෞද්ධ ඉගැන්වීම වන්නේ,
1. සතර අගතිය යි. 2. සතර ඍධිපාදය යි.
3. සතර සතිපට්ඨානය යි. 4. සතර සංග්‍රහ වස්තු යි.

13. දැහැමෙන් උපයාගත් ධනය පරිභෝජනය කළ යුතු ආකාරය පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ ''පත්තකම්ම සූත්‍රය'' දේශනා කළේ,
1. අනේපිඬු සිටුතුමාට ය. 2. බිම්බිසාර රජතුමාට ය.
3. කොසොල් රජතුමාට ය. 4. උග්ග සිටුතුමාට ය.

14. මහ ඇතාගේ අඩි සලකුණු තුලට වනයේ වෙසෙන ඕනෑම සතෙකුගේ අඩි සලකුණු ඇතුළු කළ හැකි වන්නා සේ ම, අවුරුදු හතලිස් පහක් මුළුල්ලේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ඇතුළත් කළ හැකි ප්‍රධානම කරුණ වන්නේ,
1. සතර ඍධිපාදය යි. 2. සතර සතිපට්ඨානය යි.
3. චතුරාර්ය සත්‍ය යි. 4. පටිච්ච සමුප්පාදය යි.

15. ඇතිවීම නැතිවීම හේතුවෙන් හටගන්නා දුක ධර්මයේ හැඳින්වෙන්නේ .................... යනුවෙනි.
1. විපරිණාම දුක්ඛතා 2. දුක්ඛ දුක්ඛතා 3. වේදනා දුක්ඛතා 4. සංඛාර දුක්ඛතා

16. අකුසලය අකුසල මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල විපාකය ද, කුසල ද කුසල විපාක ද දැන දැක ගන්නා ඥානය අරි අටඟි මගෙහි,
1. සම්මා කම්මන්ත නම් වේ. 2. සම්මා දිට්ඨි නම් වේ.
3. සම්මා සති නම් වේ. 4. සම්මා වායාම නම් වේ.

17. ''සිතින් දැඩිව අල්ලා ගැනීම හේතුකොට ගෙන නැවත නැවත භවයට එකතු වේ.'' යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද පාඨය වන්නේ,
1. ''සංඛාර පච්චයා විඤ්ඤාණං'' ය යි. 2. ''ඵස්ස පච්චයා වේදනා'' ය යි.
3. ''උපාදාන පච්චයා භවො'' ය යි. 4. ''භව පච්චයා ජාති'' ය යි.

18. කර්මය හා කර්ම විපාකය පිළිබඳව බෞද්ධ විග්‍රහයට අනුව අන් සැපතට ඊර්ෂයා කරන්නා,
1. අල්පේශාඛ්‍යව උපදී 2. අල්පභෝගීව උපදී 3. මහේශාඛ්‍යව උපදී 4. ආබාධ සහිතව උපදී

19. අටුවා ග්‍රන්ථවල සම්මා දිට්ඨිය පස් ආකාරයකින් විස්තර කර ඇති අතර, තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම හඳුන්වන්නේ,
1. ධ්‍යාන සම්මා දිට්ඨිය ලෙස ය. 2. විදර්ශනා සම්මා දිට්ඨිය ලෙස ය.
3. මාර්ග සම්මා දිට්ඨිය ලෙස ය. 4. කම්මස්සකතා සම්මා දිට්ඨිය ලෙස ය.

20. ජාතිය ධනය ගෝත්‍රය පිළිබඳ මානයෙන් උදම් වී ස්වකීය ඥාතීන් පහත් කොට සිතීම පිරිහීමට හේතුවක් බව දේශනා කර ඇත්තේ,
1. වසල සූත්‍රයේ ය. 2. පරාභව සූත්‍රයේ ය.
3. මහා මංගල සූත්‍රයේ ය. 4. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.

21. උත්සහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙලා ධාර්මික රැකියාවක නිරත වීම ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන්නේ,
   1. සමජීවිකතා නමිනි.
   2. ආරක්ඛ සම්පදා නමිනි.
   3. උට්ඨාන සම්පදා නමිනි.
   4. කල්‍යාණ මිත්තතා නමිනි.

22. ''දුශ්ශීලව නොසංසුන් සිත් ඇතිව අවුරුදු සියයක් ජීවත් වනවාට වඩා සිල්වත්ව සංසුන් සිත් ඇතිව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨය'' මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල්දෙපදය වන්නේ,
   1. ''සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො'' යන්න ය.
   2. ''යොචෙ වස්සසතං ජීවේ - දුස්සීලො අසමාහිතො'' යන්න ය.
   3. ''සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු අසංවුතං'' යන්න ය.
   4. ''තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති'' යන්න ය.

23. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව ප්‍රකාශ කළ ප්‍රථම උදාන වාක්‍යයෙන් දුක් සහිත පංචස්කන්ධය නමැති ගෘහය නිර්මාණය කරන අදෘශ්‍යමාන බලවේගය ලෙස හඳුන්වා ඇත්තේ,
   1. අවිද්‍යාව ය.
   2. වේදනාව ය.
   3. විඤ්ඤාණ ය.
   4. තෘෂ්ණාව ය.

24. සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමා මුලින්ම බුදුරජාණන් වහන්සේ මුණ ගැසුනේ,
   1. රජගහනුවර සීත වනයේ දී ය.
   2. වේළුවනාරාමයේ දී ය.
   3. ජේතවනාරාමයේ දී ය.
   4. නිග්‍රෝධ ශාක්‍ය කුමරුගේ උයනේදී ය.

25. බුදුරජාණන් වහන්සේ අනුවණයින් ඇසුරු නොකිරීම, නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම ආදී පුද්ගල දියුණුවට ඉවහල් වන කරුණු දේශනා කරනු ලැබුවේ,
   1. බ්‍රහ්මයෙකුට ය.
   2. ගෘහතියෙකුට ය.
   3. දෙවියෙකුට ය.
   4. බ්‍රාහ්මණයෙකුට ය.

26. ''කාලාමයෙනි, මේ දහම සපුරාගත්, සමාදන් කොට ගත් තැනැත්තාට අවැඩ පිණිසම වන්නේ යැයි යම් කලෙක ඔබට වැටහේ නම් එකල්හි ම එය බැහැර කළ යුතුය.'' මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වන්නේ,
   1. සත්‍යගරුක බවය.
   2. විමර්ශනශීලී බවය.
   3. උපායශීලී බවය.
   4. ප්‍රතිපත්තිගරුක බවය.

27. දස අකුසල් අතර මනෝකම්ම ගණයට අයත් නොවන අකුසලය වන්නේ,
   1. ව්‍යාපාද ය.
   2. අභිද්‍යා ය.
   3. මිථ්‍යාදෘෂ්ටි ය.
   4. විචිකිච්ඡා ය.

28. ''දානං ච ධම්මචරියා ච'' යන ගාථාවේ දැක්වෙන මංගල කරුණු අතරට අයත් නොවන කරුණු ඇතුළත් වරණය වන්නේ,
   1. දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම යි.
   2. දානය, ධර්මයේ හැසිරීම, ඥාතීන්ට සංග්‍රහ කිරීම යි.
   3. දානය, ධර්මයේ හැසිරීම, නිවැරදි කර්මාන්ත කිරීම යි.
   4. ඥාති සංග්‍රහය, නිවැරදි කර්මාන්ත කිරීම, දහමෙහි හැසිරීම යි.

29. භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ඨතම මහා කාව්‍යය වන්නේ,
   1. අමාවතුර යි.
   2. පූජාවලිය යි.
   3. සද්ධර්ම රත්නාවලිය යි.
   4. කව්සිළුමිණ යි.

30. සක්විති රජෙකු රාජ්‍ය පාලනය කරන විටදී සප්ත රත්නය නමින් වටිනා සම්පත් හතක් පහළ වන අතර ඉන් පළමුවැන්න වනුයේ,
1. මණි රත්නය යි. 2. චක්‍ර රත්නය යි. 3. හස්ති රත්නය යි. 4. ස්ත්‍රී රත්නය යි.

31. විභාෂා නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කර තඹ පත්තිරුවල ලියා සෙල්මුවා මඤ්ජුසාවල බහා ස්තූපයක තැන්පත් කරන ලද්දේ,
1. අලුවිහාර ධර්ම සංගායනාවේ දී ය. 2. කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය.
3. ප්‍රථම ධර්ම සංගායනාවේ දී ය. 4. තෙවන ධර්ම සංගායනාවේ දී ය.

32. මහියංගන ස්තූපය හා කැළණි විහාර ස්තූපය ගොඩනංවා ඇත්තේ පිළිවෙළින් කිනම් ස්තූප ආකෘතීන්ට අනුව ද?
1. ඝණ්ඨාකාර - ධාන්‍යාකාර 2. ධාන්‍යාකාර - ඝණ්ඨාකාර
3. බුබ්බුලාකාර - ඝණ්ඨාකාර 4. ඝණ්ඨාකාර - ඝටාකාර

33. ඒ ඒ කර්ම කොටස් මුඛ පරම්පරාවෙන් රැකගෙන ඉදිරියට ගෙන ඒම සඳහා භාණක පරම්පරාවලට භාර දුනි. ඒ අනුව සංයුක්ත නිකාය භාර දෙනු ලැබුවේ,
1. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පරම්පරාවට ය.
2. ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට ය.
3. මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට ය.
4. අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට ය.

34. ගන්ධ කුටි සම්ප්‍රදාය අනුව නිර්මාණය කරන ලද ප්‍රතිමාඝරයක් වන්නේ,
1. රත්න ප්‍රාසාදය යි. 2. තොළුවිල යි. 3. නාලන්දා ගෙඩිගෙය යි. 4. තිවංක පිළිමගෙය යි.

35. බුදුරජාණන් වහන්සේ ගැටලු විසඳීම සංකේතවත් කිරීමට යොදා ගෙන ඇති මුද්‍රාව වන්නේ,
1. අභය මුද්‍රාව යි. 2. ධ්‍යාන මුද්‍රාව යි. 3. වරද මුද්‍රාව යි. 4. විතර්ක මුද්‍රාව යි.

36. බුද්ධ ප්‍රතිමාවල දණහිස් නවා පතුල් උඩ අතට සිටින සේ වම් පතුල දකුණු කලවා මත ද, දකුණු පතුල වම් කලවා මත ද තබාගෙන සිටින ඉරියව්ව වන්නේ,
1. පද්මාසනය යි. 2. වීරාසනය යි. 3. භද්‍රාසනය යි. 4. වජ්‍රාසනය යි.

37. බුදුරජාණන් වහන්සේ විසින් සිත්කලු ස්ථාන ලෙස වර්ණනා කරන ලද නිග්‍රෝධය, චෞර ප්‍රපාතය, කාලශිලාව, තපෝදාරාමය වැනි ස්ථාන පිහිටා ඇත්තේ,
1. විශාලා මහනුවර ය. 2. කුසිනාරා නුවර ය. 3. සැවැත් නුවර ය. 4. රජගහ නුවර ය.

38. මහනුවර යුගයට අයත් සිතුවම් දැකිය හැකි ස්ථානයක් වන්නේ,
1. මැදවල විහාරය යි. 2. තිවංක පිළිමගෙය යි. 3. හිඳගල යි. 4. බෙල්ලන්විල විහාරය යි.

39. තම නිවසට පැමිණෙන ආගන්තුකයින්ට සැලකීම දහමේ හැඳින්වෙන්නේ ............................... යනුවෙනි.
1. දේවතා බලි 2. ඥාති බලි 3. අතීති බලි 4. පුබ්බපේත බලි

40. ''බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු'' යනුවෙන් බුදුන් වහන්සේගේ නව අරහාදී ගුණ වර්ණනා කෙරෙන අමෘතාවහ නම් කෘතිය රචනා කරන ලද්දේ,
1. වීදාගම මෛත්‍රී හිමි ය. 2. ගුරුළුගෝමී පඬිතුමා ය.
3. විද්‍යා චක්‍රවර්තීන් ය. 4. තොටගමුවේ රාහුල හිමියන් ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 2025**
**Third Term Test - 2025**

**11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය - II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. (i) නාලාගිරි හස්තිරාජයා දමනය කිරීමෙන් ප්‍රකට වන බුදුගුණය ලියා දක්වන්න.

(ii) ''අනවජ්ජ සුඛය'' යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.

(iii) ''කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ'' මෙම පාඨයේ අදහස ලියන්න.

(iv) තේමිය ජාතකයෙන් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණෝ සම්පූර්ණ කළ කිනම් පාරමිතාවද?

(v) තුන්තරා බෝධිය නම් කරන්න.

(vi) සිවුවනක් පිරිස නම් කරන්න.

(vii) බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ගිජුලෙස ආහාර ගන්නා පුද්ගලයන් 02 කු නම් කරන්න.

(viii) රේරුකානේ චන්දවිමල නාහිමියන් රචිත ග්‍රන්ථ දෙකක් ලියන්න.

(ix) පොළොන්නරු යුගයට අයත් සිංහලෙන් රචිත ගී කාව්‍ය දෙක නම් කරන්න.

(x) අනුරාධපුර යුගයේ සඳකඩ පහණේ දැකිය හැකි සතුන් හතර නම් කරන්න.

(ලකුණු 2x10 =20)

02. (i) දස පාරමිතා වලින් දෙකක් නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කළ එක් පාරමිතාවක් පැහැදිලි කරන්න.

(iii) ''පාරමිතා ගුණධර්ම ශිෂ්‍ය ජීවිතයට ප්‍රගුණ කිරීමෙන් යහපත් පුද්ගල හා සමාජ ජීවිතයක් ගොඩනගා ගත හැකිය.'' අගයන්න.

(ලකුණු 2+3+5 = 10)

03. (i) ''සුකරානි අසාධුනී'' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගලයා වරදින් මුදවා සුචරිතයේ යෙදීම සඳහා ධම්මපදයෙන් ලැබිය හැකි ආදර්ශ අගය කරන්න.

(ලකුණු 2+3+5 = 10)

04. (i) ''චේතනාහං භික්ඛවේ කම්මං වදාමි'' යන පාඨයේ අදහස ලියන්න.

(ii) විපාක දෙන ආකාරය අනුව කර්මය බෙදා දක්වන ආකාර හතර ලියන්න.

(iii) ''කුසල් අකුසල් පිළිබඳව අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම තුළින් යහපත් දෙලොව ජීවිතයක් ගොඩනගා ගත හැකිය.'' විමසන්න.

(ලකුණු 2+3+5 = 10)

05. (i) සිඟාලෝවාද සූත්‍රයේ පෙරදිග දිසාවට උපමා කරනුයේ කවුරුන් ද?

(ii) ඉහත (i) හි දැක්වූ එක් සමාජ කණ්ඩායමකින් **ඔබට** ඉටුවිය යුතු යුතුකම් 03 ක් ලියන්න.

(iii) ගුරු සිසු යුතුකම් මනාව ඉටුකිරීමෙන් සමස්ත පාසල් පද්ධතිය තුළ ඇතිවන ගැටලු නිරාකරණය කරගත හැකි. විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

06. (i) තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු කෙටියෙන් පහදන්න.

(ii) එම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය හා මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේ නම් කරන්න.

(iii) ''බුදු දහමේ දේශාන්තර ව්‍යාප්තිය සිදු වූයේ තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය.'' විස්තර කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ

(ii) සම්මා ආජීව

(iii) නූතන යුගයේ චිත්‍ර කලාව

(iv) අලුවිහාර සංගායනාව

(ලකුණු 5+5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(2) | 5 -(3) | 6 -(1) | 7 -(3) | 8 -(2) | 9 -(4) | 10 -(1) |
| 11-(2) | 12 -(4) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(2) | 17 -(3) | 18 -(1) | 19 -(4) | 20 -(2) |
| 21-(3) | 22 -(2) | 23 -(4) | 24 -(1) | 25 -(3) | 26 -(2) | 27 -(4) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(2) | 35 -(4) | 36 -(1) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. i. පුරිසදම්මසාරථී ගුණය
ii. නිවැරදි කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම කිරීමෙන් ලැබෙන සතුට
iii. කයෙන් හා වචනයෙන් කරන ක්‍රියාවන් යහපත් වේ. (කායික වාචසික ක්‍රියා යහපත් වේ.)
iv. අධිෂ්ඨාන පාරමිතාව
v. බුදු / පසේ බුදු / මහරහත් (සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ. අරහත්ත බුද්ධ)
vi. භික්ෂු / භික්ෂුණී / උපාසික / උපාසිකා
vii. ආහාර හත්ථක, අලංසාටක, කාකමාසක, තත්ථාවට්ටක, භුත්තවමිතක
viii. පොහොය දිනය, පාරමිතා ප්‍රකරණය, බෞද්ධයාගේ අත්පොත, ධර්ම විනිශ්චය
ix. මුවදෙව්දාවත, සසඥාවත
x. ඇත්, අස්, ගව, සිංහ

(ලකුණු 2X10 =20)

02. i. දාන, ශීල, නෙක්ඛම්ම, ප්‍රඥා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා
ii.
- දාන :- දානය යනු නිර්ලෝභීව පරිත්‍යාග කිරීමයි. දානය පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙන් ලෙස දෙයාකාරය. දානය පාරමිතාවක් ලෙස ත්‍රිවිධාකාරය (පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී) වෙස්සන්තර, සිවි හා සස යන ජාතක කතා ඇසුරින් විස්තර කරන්න.
- ශීල :- කය වචනය සංවර කර ගැනීමයි. කයින් වචනයෙන් වන අකුසල් නම් කර එය පාරමිතාවක් ලෙස බෙදෙන ආකාරය විස්තර කරන්න.
- නෙක්ඛම්ම :- පංච ඉන්ද්‍රියන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත් වීමයි. එයද පාරමිතාවක් ලෙස ත්‍රිවිධාකාරව බෙදෙන ආකාරය විස්තර කරන්න.
- ප්‍රඥා :- ලෝකය හා ජීවිතය දෙස යථාර්ථව අවබෝධ කර ගැනීමයි. ප්‍රඥාව පාරමිතාවක් ලෙස ත්‍රිවිධාකාරය. ප්‍රඥාව දියුණු කරන ක්‍රම 03 කි. චින්තාමය, භාවනාමය, සුතමය ලෙස විස්තර කරන්න.
- විරිය :- යම් අරමුණක් ඉටුවන තුරු නොපසුබස්නා උත්සහයෙන් කටයුතු කිරීමයි. විරිය පාරමිතාවක් ලෙස ත්‍රිවිධාකාරය. විරිය ඇති කරගත යුතු ආකාර ලෙස ආරම්භ ධාතු, නික්ඛම ධාතු, පරක්කම ධාතු ලෙස ත්‍රිවිධාකාරය.
- ඛන්ති :- එනම් ඉවසීමයි. ඛන්තිය ද පාරමිතාවක් ලෙස ත්‍රිවිධාකාරය. කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ජාතක කතාවද ඇතුලත්ව)
- සච්ච :- කිසිවෙකු නොරවටා සත්‍යගරුක වීමයි. වචනයෙන් වන අකුසලයන්ගෙන් වැලකී යහපත් ජීවිතයක් ගත කරන අයුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
- අධිට්ඨාන :- යම් අරමුණක් ඉටුවන තුරු තම අරමුණ නොවෙනස්ව පවත්වා ගැනීමයි. අධිෂ්ඨානය පාරමිතාවක් ලෙස බෙදෙන ආකාරය නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
- මෙත්තා :- එනම් මිත්‍රත්වයයි. කයින්, වචනයෙන් මනසින් මෛත්‍රියෙන් ක්‍රියා කළ යුතුය. මෛත්‍රිය පාරමිතාවක් ලෙස පුරන ආකාරය විස්තර කරන්න.
- උපෙක්ඛා :- එනම් මධ්‍යස්ථ බවයි. අටලෝ දහමින් කම්පා නොවී මධ්‍යස්ථව කටයුතු කළ යුතුය. උපේක්ෂාව පාරමිතාවක් ලෙස බෙදෙන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. සසර සයුරින් එතෙර වීමට සම්පූර්ණ කරන ගුණ ධර්ම සමූහය බුද්ධකාරක ධර්ම හෙවත් පාරමිතා නම් වේ. දානාදී ගුණධර්ම තණ්හාවෙන්, මානයෙන් හා මිථ්‍යා දෘෂ්ටියෙන් තොරව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව වැඩිය යුතුය. මෙම පාරමිතා ශිෂ්‍ය ජීවිතයට ආදර්ශ ලෙස ගන්නා විට අවම වශයෙන් පාරමිතා තුනක්වත් ඇතුළත් වන සේ පිළිතුර ගොඩනැගිය යුතුය. ශිෂ්‍යයන් වශයෙන් දානය, සත්‍යගරුක වීම, ඉවසීම, ප්‍රඥාව, වීර්ය, අධිෂ්ඨානය යනාදිය ප්‍රගුණ කළ යුත්තේ කෙසේද යන්නත්, විභාගයකට මුහුණ දීමේ දී වීර්ය මෙන්ම අධිෂ්ඨානය පවත්වා ගත යුත්තේ කෙසේ ද යන්නත් ඒවා සාර්ථකය ජයගත යුත්තේ කෙසේ ද යන්නත් ඉවසීමෙන් කටයුතු කරන ආකාරයට මෙන්ම පරිත්‍යාගශීලීව සිටිය යුත්තේ කෙසේද යන්නත් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

03. i. සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානි ච
යං වේ හිතං ච සාධුං ච - තං වේ පරමදුක්කරං
ii. තමාට අහිත වූ අයහපත් දේ කිරීම පහසුය. යම් ක්‍රියාවක් තමන්ට යහපත් වැඩදායක නම් එවැනි ක්‍රියා කිරීම අපහසුය.
iii. බෞද්ධයාගේ අත්පොත හෙවත් හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි. ගාථා 423, වග්ග 26, නිදාන කතා 299 න් යුත් ධම්මපදයේ ගාථා අධ්‍යනය කරන විට පුද්ගලයන්ට යහපත් නිවැරදි ජීවිතයක් ගත කිරීමට මනා වූ උපදෙස් ගණනාවක් දී ඇත. උත්සහවන්ත බව, ධාර්මිකව ජීවත් වීම, නිවැරදි දේ කිරීම මේ අරමුණක් ඉටු වන තුරු අධිෂ්ඨානශීලීව සිටීම යනාදිය සඳහා මනා වූ උපදෙස් ලබා දී ඇත. ඔබ කැමති ධම්මපද ගාථා 03 ක් වත් ඇතුළත් වන සේ පිළිතුර ගොඩනගා ඇත්නම් එහි අර්ථය සුචරිතවත් වීම උදෙසා සවිතර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

04. i. මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි.
ii. ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම
iii. කුසල් යනු යහපත් ක්‍රියාවන අතර අකුසල් යනු අයහපත් ක්‍රියාවන්ය. කුසල් හෙවත් යහපත් ක්‍රියාවන් දස කුසල් වලින් අපට හඳුනාගත හැකිය. ඒවා කයින්, වචනයෙන්, සිතින් නිවැරදි ලෙස කළ යුතුය. (දස කුසල් වලින් 05 ක් වත් නම් කරන්න.) අකුසල් යන අයහපත් ක්‍රියාවන්ය. දස අකුසල් හෙවත් ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිත්‍යාචාරය, බොරු කීම යනායදි නම් කර දීම අකුසල් වලින් වැලකී කුසලය හෙවත් නිවැරදි දේ කළ යුතු ආකාරය දැක්විය යුතුය. නිදසුනක් ලෙස බොරු කීමෙන් වැළකී සත්‍යගරුක වීම තමන්හට මෙන්ම අන් අයටත් යහපතක් බව දැක්වීම. යනාදිය දක්වා පිළිතුරු ගොඩනගා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

05. i. මා පිය දූදරු සබඳතාවය
ii. පවින් වළක්වයි, යහපතෙහි යෙදවයි, නිසි කළ අධ්‍යාපනය ලබා දීම, නිසි කළ ආවාහ විවාහ කර දීම, නිසි කළ දේපල උරුම ලබා දීම.
iii. ගුරු ශිෂ්‍ය සබඳතාව සමාජයේ දක්නට ඇති ප්‍රධාන සමාජ කණ්ඩායමකි. ගුරුවරු දකුණු දිසාවට උපමා කරනුයේ දක්ෂිණාවරණයෙන් පිදීමට සුදුසු හෙයින්ය. යහපත් ගුරු ශිෂ්‍ය සබඳතාවකට යුතුකම් මනාව ඉටුවිය යුතුය. ගුරුවරයාගෙන් ශිෂ්‍යයාව මනාසේ හික්මවීම, මනාසේ ඉගැන්වීම, සියලු ශිල්ප ඉගැන්වීම ආදී යුතුකම් ද ශිෂ්‍යාගෙන් ගුරුවරයාට දුටු විට හුනස්නෙන් නැගිටීම, උපස්ථාන කිරීම. හොඳින් ඉගෙනීම ආදී යුතුකම් නම් කර තිබිය යුතුය. මෙම අන්‍යෝන්‍ය යුතුකම් ඉටු වීමෙන් පරමාදර්ශී සමාජයකට මඟ පෑදේ. ශිෂ්‍යයන් ගුරුවරුන්ට නිසි ගරු සැලකිලි දැක්විය යුතුය. ගුරුවරයාගේ උපදෙස් පිළිපැදිය යුතුය. ගුරුවරයා ද ශිෂ්‍යයාට දයාවෙන් කරුණාවෙන් ක්‍රියා කළ යුතුය. මෙසේ යුතුකම් ඉටු කිරීමෙන් ගුරු ශිෂ්‍ය ගැටුම් නිරාකරණය වන බව පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

06. i. ලාභ සත්කාර අපේක්ෂාවෙන් භික්ෂූන් සසුන්ගත වීම.
ii. ස්ථානය :- පාටලීපුත්‍රයේ අශෝකාරාමය
අනුග්‍රහය :- ධර්මාශෝක රජු
මූලිකත්වය :- මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ
iii. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු පාටලී පුත්‍රයේ අශෝකාරාමයේ මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් ධර්මාශෝක රජුගේ අනුග්‍රහයෙන් පැවති තෙවන ධර්ම සංගායනාවෙන් පසු බුදු සසුන දේශාන්තර ව්‍යාප්තිය සිදු විය. දුශ්ශීල මහනුන් නෙරපා හැරීමෙන් පවිත්‍ර වූ මෙම පිරිසිදු බුදු දහම ථේරවාදී රටවල් 09 නට ව්‍යාප්ත විය. (කාශ්මීරය, මහිස මණ්ඩල, මහාරට්ඨ, ස්වර්ණභූමිය, හිමවන්ත ප්‍රදේශය, තම්බපණ්ණිය යනාදී රටවල් හා ඒවාට ගිය ධර්මදූතයන් වහන්සේලා ද නම් කරන්න.) එමෙන් මහින්දාගමනය සිදු වූයේද මෙම තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය. එමගින් බුදු දහමින් සුරක්ෂිත රටක් මෙන්ම කලා ශිල්පයන් ද අප රටට දායාද විය. මෙයාකාරයට රටවල් 05 ක් වත් ධර්මදූත කණ්ඩායම් සමඟ නම්කර පිළිතුර ගොඩනගා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (11 වසර 114 / 115 පිටු)

(ලකුණු 2+3+5 = 10)

07. i. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියෝ :- 1698 ජූනි 18 උඩරට තුම්පනේ වැලිවිට ගමේ කුලතුංග බණ්ඩාර නමින් ඉපදුණි. වයස 16 දී මහනුවර සූරියගොඩ විහාරයේ දී වැලිවිට සරණංකර නමින් පැවිදි වී ඉතා දුෂ්කරව පාලි, සංස්කෘත භාෂාවන් ඉගෙන ගනී. පිණ්ඩපාතික සරණංකර අසරණ සරණ සරණංකර නම් වලින් හැඳින්විය. සිල්වත් සමාගම පිහිටුවීම, සියම් නිකාය පිහිටුවීමට මූලික වීම, සංඝරාජ ධුරට ලැබීමෙන් උඩගු නොවීම. මුණිගුණ අලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සතර බණවර සන්නය, රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය යන ග්‍රන්ථ රචනා කිරීම ආදර්ශ ද ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
ii. සම්මා ආජීව :- චතුරාර්ය සත්‍යයේ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යයේ ඇති ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සීල ශික්ෂාව යටතේ ඇති අංගයකි සම්මා ආජීව. එනම් නිවැරදි දිවි පැවැත්ම හෙවත් නිවැරදි රැකියාවයි. පංචවිධ වෙළඳාමෙන් වැළකී කෘෂිකර්මය, නිවැරදි වෙළඳාම, රාජ්‍ය සේවය නිවැරදි කර්මාන්තයන් හි නිරත වීම. වෙළඳාමේ දී වන තුලා කූට, මාන කූට, කංස කූට ආදී වැරදි රැකියා වලින් බැහැර වීම ධාර්මිකව ධනය ඉපයීම ආදිය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
iii. නූතන යුගයේ චිත්‍ර කලාව :- යුරෝපීය ආභාශයට රිචඩ් හෙන්රිකස්, එම්. සාර්ලිස් යන අය ආදී චිත්‍ර දැක්වීම එමෙන්ම වෙනත් සිතුවම්කරුවන් ලෙස සෝලියස් මෙන්දිස්, සෝමබන්දු විද්‍යාපති, ජෝර්ජ් කීට්, ඇල්බට් ධර්මසිරි යනාදිය අඳින ලද කැළණි විහාරයේ, බොරැල්ලේ ගෝතමී විහාරය, බෙල්ලන්විල විහාරයේ සිතුවම් ආදිය මෙන්ම ඒවායේ සුවිශේෂීත්වය දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (18/19 සියවස්වල අගභාගයේ චිත්‍ර කලාව)
iv. අලුවිහාර සංගායනාව :- පුස්තකාරූඪ සංගීතිය හෙවත් ත්‍රිපිටකය පුස්කොළ පොත්වල රචනා වූයේ අලුවිහාර සංගායනාවේදීය. එයට හේතූන් ලෙස යුධ ගැටුම්, බැමිණිතියා සාගතය, භික්ෂූන්ගේ ශාසනික පිළිවෙත් පිරිහී යාම, භික්ෂූන් කණ්ඩායම් ලෙස බෙදීම ආදිය දැක්වීම. මාතලේ අලුවිහාරයේ භික්ෂූන් 500 ගේ සහයෙන් මාස 06 ක් පුරාවට ප්‍රාදේශීය නායකයකුගේ ප්‍රධානවත්වයෙන් මෙය පැවැත්වූ අතර මෙහි ප්‍රතිඵල ලෙස මෙරටත් වෙනත් රටවලත් ධර්මය අභාවයට ගියහොත් එය ස්ථාපිත කිරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම රීස් ඩේවිඩ් පඬිතුමා පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවා ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම ආදිය දැක්වීම.

(ලකුණු 5+5 = 10)

# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.


LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE

## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE